සියලු ම හිමිකම් ඇවිරිණි/ All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

**තෙවන වාර පරීක්ෂණය - 08 ශ්‍රේණිය - 2023**
**Third Term Test - Grade 08 - 2023**

# පුරවැසි අධ්‍යාපනය

**කාලය පැය 02 යි**

නම / විභාග අංකයඃ

## I කොටස

- අංක 01 සිට 05 දක්වා ප්‍රශ්න වලට නිවැරදි පිළිතුරු වරහන් තුළින් තෝරා හිස්තැන් මත ලියා දක්වන්න.

01. පොදු සේවා සැපයීමේ අරමුණ ජනතාවගේ .................................... ඇති කිරීමයි.
(ආගමික සංවර්ධනයක්, ජීවන තත්ත්වයේ ගුණාත්මක සංවර්ධනයක්,ආර්ථික සංවර්ධනයක්)

02. ප්‍රජාතන්ත්‍රවාදය ...................................... මෙන්ම ජීවන ක්‍රමයක් ද වේ.
(පාලන ක්‍රමයක්, සදාචාර ක්‍රමයක්, සංස්කෘතික ක්‍රමයක්)

03. පුද්ගලයෙකු උපන්දා සිට මිය යන මොහොත දක්වාම හැසිරෙන්නේ තම ................................ අනුකූලව ය.
(සංස්කෘතියට, ආත්මාභිමානයට, හෘද සාක්ෂියට)

04. අනාගත පරපුරට ඔවුන්ගේ අවශ්‍යතා ඉටු කර ගැනීමට බාධා නොවන අයුරින් වත්මන් පරපුරේ අවශ්‍යතා ඉටුකර ගැනීම ................................................ලෙස සරලව හඳුන්වා දිය හැකිය.
(සංවර්ධනය, තිරසර සංවර්ධනය, ඵලදායිතා වර්ධනය)

05. චිත්තවේග හැසිරවීම, ඵලදායී සන්නිවේදනය, අන්තර් පුද්ගල සබඳතා පැවැත් වීම යන ගුණාංග අභියෝග ජය ගැනීම සඳහා පුද්ගලයෙකු ප්‍රගුණ කල යුතු ............................................ නිපුණතා වේ.
(නිර්මාණශීලී, චර්යාමය, මනෝ සමාජීය)

ප්‍රශ්න අංක 06 සිට 10 දක්වා දී ඇති ප්‍රකාශ හරි නම් (√) ලකුණ ද, වැරදි නම් (x) ලකුණ ද ඉදිරියේ ඇති වරහන තුළ යොදන්න.

06. එකිනෙකා අතර අවබෝධය ඇති වී විශ්වාසයෙන් යුතුව කටයුතු කිරීම නිසා ගැටුම් අවම වේ. (     )

07. පාස්කු උත්සවය යනු ඉස්ලාම් බැතිමතුන් විසින් සමරන ප්‍රධාන සංස්කෘතික උත්සවයක් වේ (     )

08. මධ්‍යම පරිසර අධිකාරිය හා සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය යනු පරිසරය සංරක්ෂණය සඳහා පෞද්ගලික අංශය මගින් පිහිටුවා ඇති ආයතන වේ. (     )

09. ශ්‍රමාභිමානයෙන් යුතුව සේවය කිරීම තෘප්තිමත් බවට හේතු වේ (     )

10. අයහපත් චිත්තවේග සමනය සඳහා යොදා ගත හැකි ක්‍රියාමාර්ගයක් ලෙස නිර්මාණකරණයට යොමු වීම හැඳින්විය හැක. (     )

● අංක 11 සිට 15 දක්වා ප්‍රශ්න වලට නිවැරදි පිළිතුර දී ඇති පිළිතුරු අතරින් තෝරා යටින් ඉරක් අඳින්න.

11. ලෝක සෞඛ්‍ය සංවිධාන (World Health organization - WHO) විසින් ප්‍රකාශ කරන පරිදි මෑතකදී ශ්‍රී ලංකා වෙන් සම්පූර්ණයෙන්ම තුරන් කරන ලද රෝගය කුමක්ද?

1. ඩෙංගු　　2 ක්ෂය රෝගය　　3 මැලේරියාව　　4 දියවැඩියාව

12. ඈත අතීතයේ සිට ම අප එරටේ පිත්තල බඩු කර්මාන්තය පිළිබඳව වඩාත් ප්‍රසිද්ධියක් උසුලන්නේ,

1. පිළිමතලාව　　2 අම්බලංගොඩ　　3 මොළගොඩ　　4 අනුරාධපුරය

13. බහු සංස්කෘතික රටක් ලෙස ඉන්දියාව තුළ භාවිත කරන භාෂාවක් වන්නේ,

1. සැමෝන්　　2 මලයාලම්　　3 ප්‍රංශ　　4 ස්පාඤ්ඤ

14. ගැටලුවක් ඵලදායීව විසඳීමෙන් ලැබෙන ප්‍රයෝජනයක් නොවන්නේ,

1. අරමුණු ඉටුවීම　　2 අසහනය දුරුවීම

3 සහයෝගය වර්ධනය වීම　　4 ගැටුම් වර්ධනය වීම

15. ගංවතුර ඇති වීම සඳහා බලපාන ස්වභාවික හේතුවක් වන්නේ මින් කුමක්ද?

1. මෝය කට අවහිර වීම　　2 වනාන්තර විනාශ කිරීම

3. දිරාපත් නොවන ද්‍රව්‍ය අනිසි ලෙස බැහැර කිරීම　　4 වගුරු බිම් ගොඩ කිරීම

● අංක 16 - 20 දක්වා A හා B තීරු දෙකේ සම්බන්ධතාව තේරුම් ගෙන යා කරන්න.

| | |
|---|---|
| 16. ප්‍රජාතන්ත්‍රවාදී නායකයෙකු සතුවිය යුතු ගුණාංගයකි. | සොයිචිරෝ හොන්ඩායි |
| 17. තමන්ට පැවරී ඇති කාර්යය සතුටින් හා කැමැත්තෙන් යුතුව ඉටු කිරීම | ඊ.බී. ටයිලර් |
| 18. නාමික නායකත්ව ශෛලියේ එක් ලක්ෂණයකි | ශ්‍රමාභිමානය |
| 19. සංස්කෘතිය පිළිබඳ නිර්වචන ඉදිරිපත් කල පුද්ගලයෙකි. | තමා කැපී පෙනීමට උත්සාහ කිරීම |
| 20. අභියෝග ජයගත් පුද්ගලයෙකි. | සමාජශීලී බව |

## II කොටස

- පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.
- පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

01. A  B  C  D 

i. ඉහත රූප සටහන් හොඳින් නිරීක්ෂණය කර ඒ මගින් නිරූපණය වන විපත් හා අනතුරු නම් කරන්න.

A ................................ C ....................................

B ................................ D .................................... (ල.04)

ii. A පින්තූරය මගින් නිරූපණය වන විපත නිසා මිනිසාට හා සතුන්ට මුහුණ දීමට සිදුවන ප්‍රතිවිපාක 04 ක් ලියන්න.

1. ..............................................................................
2. ..............................................................................
3. ..............................................................................
4. .............................................................................. (ල.04)

iii. B රූපය මගින් දක්වන අනතුරු අවස්ථාව සිදුවීම සඳහා බලපාන මූලික හේතු 04 සඳහන් කරන්න.

1. ..............................................................................
2. ..............................................................................
3. ..............................................................................
4. .............................................................................. (ල.04)

iv. D පින්තූරය මගින් 'දැක්වෙන විපත් අවස්ථාවෙන් සිදුවන හානි වලක්වා ගැනීමට ගත යුතු පියවර 04 ක් දක්වන්න.

1. .............................................................................. 3. ..............................................................
2. .............................................................................. 4. .............................................................. (ල.04)

02. 

i. ඉහත රූපයෙන් දැක්වෙන්නේ එක්තරා පොදු සේවාවක් මහජනතාව වෙත සැපයීමට පුරෝගාමී වූ පුද්ගලයෙකි. ඔහුගේ නම සඳහන් කරන්න. (ල.02)

ii. පොදු සේවා මහජනතාව වෙත සැපමිය යුත්තේ ඇයි? හේතු 03ක් ලියන්න (ල.03)

iii. ආයුර්වේද වෛද්‍ය ක්‍රමය යටතේ ශ්‍රී ලංකාව තුළ පවත්වාගෙන යන ආයතන 03ක් නම් කරන්න (ල.03)

iv. ශ්‍රී ලංකාවේ ආරක්ෂක අංශ මගින් ඉටුවන සේවා 03 ක් සඳහන් කරන්න (ල.03)

03.



i. ඉහත රූප සටහනින් දැක්වෙන චිත්තවේගය හඳුනාගෙන නම් කරන්න. (ල.02)

ii. ඉහත ඔබ සඳහන් කළ චිත්තවේගී තත්ත්වයට ඔබ දක්වන ප්‍රතික්‍රියා 03 ක් සඳහන් කරන්න. (ල.03)

iii. සමාජයේ නායකයෙක් සතු විය යුතු ගුණාංග 03ක් සඳහන් කරන්න. (ල.03)

iv. ප්‍රජාතන්ත්‍රවාදී ජීවන රටාව සමාජයේ යහපැවැත්මට හේතුවන ආකාරය කරුණු 03ක් ඔස්සේ දක්වන්න (ල.03)

04. i. අනතුරු හා ආපදා අවස්ථා වලදී සහාය ලබාගත හැකි ආයතන 02ක් නම් කරන්න. (ල.02)

ii. ස්වභාවික විපත් අවම කර ගැනීම සඳහා ඔබට ගත හැකි ක්‍රියාමාර්ග 03ක් ලියන්න. (ල.03)

iii. ඖෂධ භාවිතයේදී ඔබ විසින් සැලකිලිමත් විය යුතු කරුණු 03 ක් දක්වන්න. (ල.03)

iv. පහත මාර්ග සංඥා හඳුනා ගෙන නම් කරන්න.

A



B




C



05. i. පාසල් ශිෂ්‍යයෙක් ලෙස ඔබට මුහුණ පෑමට සිදුවන ගැටලු 02 ක් දක්වන්න. (ල.02)

ii. ගැටලු ශුභවාදීව විසඳීමෙන් ලැබෙන ප්‍රයෝජන 03 ක් ලියන්න. (ල.03)

iii.



A



B




C

.............................................................. .............................................................. ..............................................................

ඉහත A,B,C රූප වලින් දැක්වෙන්නේ අභියෝග ජයගත් ලෝක ප්‍රසිද්ධ පුද්ගලයින් තිදෙනෙකි ඔවුන් හඳුනා ගෙන නම් කරන්න. (ල.03)

iv. ඉහත ප්‍රශ්න අංක 5-III ඔබ සඳහන් කළ පුද්ගලයින්ගෙන් ඔබේ ජීවිතයට ලබා ගත හැකි ආදර්ශ 03ක් ලියා දක්වන්න. (ල.03)

06.



i. ඉහත පින්තූරයෙන් නිරූපණය වන සංස්කෘතික උත්සවය නම් කරන්න. (ල.02)

ii. ඉහත සංස්කෘතික උත්සවය සමරන ජන වර්ගය නම් කරන්න. (ල.02)

iii. බහු සංස්කෘතික සමාජයක දක්නට ලැබෙන ලක්ෂණ 03 සඳහන් කරන්න (ල.03)

iv. ජාතික සමගිය හා තිරසාර සාමය ගොඩනගා ගැනීමෙන් ඔබට අත්වන වාසි 04 ක් ලියන්න (ල.04)

07. i. යහපත් ශ්‍රමිකයකු සතු විය යුතු ගුණාංග 02ක් ලියන්න. (ල.02)

ii. සේවක අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා ශ්‍රී ලංකාවේ විධි විධාන රාශියක් ගෙන ඇත. ඉන් 3ක් නම් කරන්න (ල.03)

iii. පහතින් A,B,C,D,E,F ලෙස දැක්වෙන්නේ අයතනයේ සේවකයෙකුට ලැබෙන අයිතිවාසිකම් හා ඔහු විසින් ඉටුකළ යුතුකම් කිහිපයකි. ඒවා නිවැරදිව පහත වගුවේ වගු ගත කරන්න. (ල.03)

A - ගෞරවාන්විතව රැකියාව කිරීම

B - මහන්සි වී වැඩ කිරීම

C - රැකියාවට අදාල පුහුණු වීම්

D - සේවා ස්ථානයේ දේපළ ආරක්ෂා කිරීම

E - සේවා අවශ්‍යතා නොපිරිහෙලා ඉටු කිරීම

F - ආරක්ෂිත සේවා ස්ථානයක් ලැබීම

| | |
|---|---|
| සේවක අයිතිවාසිකම් | සේවක යුතුකම් |

(ල.06)

සියලු ම හිමිකම් ඇවිරිණි/ All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

## තෙවන වාර පරීක්ෂණය - 08 ශ්‍රේණිය - 2023
## Third Term Test - Grade 08 - 2023

## පුරවැසි අධ්‍යාපනය

## පිළිතුරු පත්‍රය

### I කොටස

1. ජීවන තත්ත්වයේ ගුණාත්මක සංවර්ධනයක්
2. පාලක ක්‍රමයක්
3. සංස්කෘතියට
4. තිරසර සංවර්ධනය
5. මනෝ සමාජීය
6. √
7. x
8. x
9. √
10. √
11. මැලේරියාව
12. පිළිමතලාව
13. මලයාලම්
14. ගැටුම් වර්ධනය වීම
15. මෝය කට අවහිර වීම
16. සමාජශීලී බව
17. ශ්‍රමාභිමානය
18. තමා කැපී පෙනීමට උත්සාහ කිරීම
19. ඊ.බී. ටයිලර්
20. සොයිචිරෝ හොන්ඩායි (2x20 = ල 40)

### II කොටස

01. A - නියඟය
    B - රිය අනතුරක්
    C - සුනාමිය
    D - අකුණු (ල 40)

ii. 1. පානීය ජල හිඟය
    2. වන සතුන් විනාශ වීම
    3. මිනිස් ජීවිත හානි
    4. වගා භූමි විනාශ වීම (පෙළ පොත පිටු අංක 81) (ල.04)

iii. 1. රියදුරන් අතින් සිදුවන වැරදි

2. පදිකයන් අතින් සිදුවන වැරදි

3. මාර්ගවල අඩුපාඩු

4. වාහනවල නුසුදුසු ධාවන තත්ත්වය (ල.04)

iv. 1. එළිමහන් ස්ථානවල රැඳී සිටීමෙන් වැළකීම.

2. හුදෙකලා ස්ථානවල හෝ උස් ගස් යට හෝ රැඳී නොසිටීම

3. දුරකථන භාවිතයෙන් වළකින්න

4. විදුලි උපකරණ පේනුවලින් ගලවා දැමීම (පෙළ පොතේ පිටු අංක 79) (ල.04)

02. i. සී.ඩබ්.ඩබ්. කන්නන්ගර මහතා (ල.02)

ii. ● ජන ජීවිතයේ එදිනෙදා කටයුතු පහසු කිරීමට

● ජනතාවගේ ජීවන තත්ත්වය යහපත් කිරීමට

● අඩු ආදායම්ලාභීන්ට සහන සැලසීමට

● සෑම පුද්ගලයෙකුටම තනි තනිව සපයා ගත නොහැකි සේවා ලබා දීමට (පිටු අංක 3) (ල.03)

iii.● ආයුර්වේද ශික්ෂණ රෝහල

● ආයුර්වේද පර්යේෂණ රෝහල්

● පළාත් සභා මගින් පාලනය වන ආයුර්වේද රෝහල් (පෙළ පොතේ පිටු අංක 11) (ල.03)

iv.● නීතිය හා සාමය ආරක්ෂා කිරීම

● මහජන ආරක්ෂාව සැපයීම

● අපරාධ පිළිබඳ මූලික විමර්ශන කටයුතු කිරීම

● පොදු දේපළ ආරක්ෂා කිරීම (පෙළ පොතේ පිටු අංක 21) (ල.03)

03. i. කෝපය (ල.02)

ii. බැණ වැදීම, පහර දීම, දෙතොල් අතපය වෙව්ලීම, වචන පැටලීම, දත්මිටි කෑම, නිහඬ වීම (ල.03)

iii. සන්නිවේදන හැකියාව, ගැටලු විසඳීමේ හැකියාව,සැලසුම් කිරීමේ හැකියාව, මෙහෙයවීමේ හැකියාව, මානව සම්බන්ධතා, ආවේදනීය හැකියාව. (ල.03)

iv. 1. ජන සමාජය තුළ සුහදතාව වර්ධනය වීම

2. ගැටුම් අවම වූ සමාජයක් බිහිවීම

3. නීති ගරුක ජන සමාජයක් බිහිවීම

4. සියලු දෙනාගේම අයිතිවාසිකම් ආරක්ෂා වීම (ල.03)

04. i. රෝහල, පොලීසිය,කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව, පළාත් පාලන ආයතන, රතු කුරුස සංවිධානය, ගිනි නිවන ඒකකය, ත්‍රිවිධ හමුදාව, ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය (ල.02)

ii. ● කඩොලාන ශාක ආරක්ෂා කිරීම

● අවිධිමත් ලෙස පතල් කැනීම සීමා කිරීම

● කැළෑ ගිනි නොතැබීම

● වෙරළ තීරයේ වැලි වැටි සුරැකීම (පෙළ පොත් පිටු අංක 82) (ල.03)

iii. • නියමිත වෛද්‍ය උපදෙස් පිළිපැදීම
- ඖෂධවල නියමිත මාත්‍රාව භාවිත කිරීම
- නියමිත වේලාවට ඖෂධ භාවිත කිරීම
- කල් ඉකුත් වීමේ දිනය ගැන සැලකිලිමත් වීම
- ඖෂධ නියමිත උෂ්ණත්වයේ ගබඩා කර තැබීම (පෙල පොත පිටු අංක 89-90) (ල.03)

iv. A - ඉදිරියෙන් මාර්ගය ඉඩ දෙනු

B - පදිකයින් මාරුවන ස්ථානය ඉදිරියෙනි

C - රථවාහන ආලෝක සංඥා ඉදිරියෙනි (ල.03)

05. i. • ආහාර හා පෝෂණ ගැටලු
- ආර්ථික අපහසුතා
- විභාග වලින් අසත් වීම
- ආදරය නොලැබීම
- තමන් ආශාකරන දේවල් නොලැබීම
- පාසල් වල පවතින සම්පත් හිගය (ල.02)

ii. • සාමය ඇති වීම
- ගැටුම් අවම වීම
- නිවැරදි වීම
- අරමුණු ඉටු වීම
- අසහනය දුරු වීම
- සුහදත්වය වර්ධනය
- සහයෝගය වර්ධනය (ල.03)

iv. A - තෝමස් අල්වා එඩිසන් මහතා

B - සොයිචිරෝ හොන්ඩා මහතා

C - සුසන්තිකා ජයසිංහ මහත්මිය (ල.03)

iv.• අභියෝග වලට සාර්ථකව මුහුණ දීම
- නොපසුබට උත්සාහය
- ඉවසීම, බවසිලිවන්ත බව
- ඕනෑම අභියොගයකට/ගැටලුවකට විසඳුම් පවතින බව (ල.03)

06. i. තෛපොංගල්/දීපවාලි උත්සව (ල.02)

ii. දෙමළ (ල.03)

iii.• විවිධ ජන වර්ග ජීවත් වීම
- විවිධ ආගම් අදහනු ලබන ජන කොටස් ජීවත් වේ
- විවිධ භාෂා කතා කරන ජන කොටස් ජීවත් වේ
- විවිධ සිරිත් විරිත් දක්නට ලැබීම
- විවිධ සංස්කෘතික ලක්ෂණ පැවතීම (ල.03)

(10) WWW.PastPapers.WiKi (9)
Download Term Test Papers, Short Notes From One Place!

iv.● එකිනෙකා අතර අවබෝධය ඇති වී විශ්වාසයෙන් යුතුව කටයුතු කිරීම නිසා ගැටුම් අවම

- ජන කොටස් අතර සමගිය තහවුරු වේ
- රට සංවර්ධනය කිරීම සඳහා සියලු දෙනාගේ සහයෝගය ලැබීම. (ල.03)

07. i. සාධාරණ බව, උපකාරී වීම, නිරවද්‍ය බව, නිර්භීතකම, ශක්තිමත් බව, දයාවන්ත බව, වෙලාවට වැඩ කිරීම, විශ්වසනීයත්වය (පෙල පොතේ 139 පිටුව) (ල.02)

ii. ● සේවක අර්ථසාධක අරමුදල් පනත

- ස්ත්‍රීන්, තරුණයන් හා ළමුන් සේවයේ යෙදවීමේ පනත
- ස්ත්‍රීන් පතල් කර්මාන්තයේ යෙදවීමේ පනත
- සාප්පු හා කාර්යාල සේවක පනත
- ශ්‍රී ලංකා විදේශ සේවා පනත
- පඩිපාලක සභා, ප්‍රසූත නිවාඩු විධිවිධාන, වෘත්තීය සංවිධාන විධිවිධාන (ල.03)

iii.

| | සේවක අයිතිවාසිකම් | සේවක යුතුකම් |
|---|---|---|
| 1. | ගෞරවාන්විතව රැකියාව කිරීම (A) | මහන්සි වී වැඩ කිරීම (B) |
| 2. | රැකියාවට අදාල පුහුණුවීම් (C) | සේවා ස්ථානයේ දේපළ ආරක්ෂා කිරීම (D) |
| 3. | ආරක්ෂිත සේවා ස්ථානයක් ලැබීම (F) | සේවා අවශ්‍යතා නොපිරිහෙලා ඉටු කර දීම (E) |

(ල.06)

PAST PAPERS WIKI
(10) WWW.PastPapers.WiKi (10)

Download Term Test Papers, Short Notes From One Place!

LOL.lk
BookStore

# විභාග ඉලක්ක පහසුවෙන් ජයගන්න

ඕනෑම පොතක් ඉක්මනින් නිවසටම ගෙන්වා ගන්න





| කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් | සඟරා | O/L ප්‍රශ්න පත්‍ර | A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත් | School Book | ගුරු අත්පොත්

pesuru Prakashana Private Ltd. | Akura Pilot | සමනල දැනුම | T | සතර

පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර, කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට

**www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න**